“හිංසා නො කළ යුතුයි. ප්රති හිංසාව ද සිදු නො කළ යුතුයි. කවරෙකු හිංසා කළේ ද අල්ලාහ් ඔහුට හිංසා කරනු ඇත. කවරෙකු අපහසුතාවයට පත් කරන්නේ ද අල්ලාහ් ද ඔහු ව අපහසුතාවයට පත් කරනු ඇත

අල්ලාහ්ගේ දූතයාණන් (සල්ලල්ලාහු අලයිහි වසල්ලම්) ප්රකාශ කළ බව අබූ සඊද් අල් කුද්රී (රළියල්ලාහු අන්හු) තුමා විසින් මෙසේ වාර්තා කරන ලදී: “හිංසා නො කළ යුතුයි. ප්රති හිංසාව ද සිදු නො කළ යුතුයි. කවරෙකු හිංසා කළේ ද අල්ලාහ් ඔහුට හිංසා කරනු ඇත.
කවරෙකු අපහසුතාවයට පත් කරන්නේ ද අල්ලාහ් ද ඔහු ව අපහසුතාවයට පත් කරනු ඇත."
[صحيح بشواهده] [رواه الدارقطني]

විවිධාකාරයෙන් මතුවන හානිය තමන්ගෙන් සහ අන් අයගෙන් දුරු කළ යුතු බවත්, එබැවින් තමාට හෝ අන් අයට හානි කිරීමට කිසිවෙකුට අවසර නොමැති බවත් නබි (සල්ලල්ලාහු අලයිහි වසල්ලම්) තුමාණෝ පැහැදිලි කළහ. ඔහුට නපුර නපුරෙන් පිරිමහ ගන්නට අවසර නැත. මක්නිසාදයත් සීමාව ඉක්මවීමෙන් තොරව, පිළිපදිනු ලබන ප්රතිචාර දැක්වීමේ මාර්ගයකින් හැර නපුර නපුරෙන් ඉවත් නොවන බැවිනි. ජනයාට නපුර සිදු කරන්නාට නපුර හිමි වන බවත්, ජනයා දුෂ්කරත්වයට පත් කරන්නාට දුෂ්කරත්වය හිමි වන බවත් නබි (සල්ලල්ලාහු අලයිහි වසල්ලම්) තුමාණන් පැහිදිළි කළහ.

http://sunnah.global/hadeeth/si/show/4711